සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 09 - 2023

## බුද්ධ ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

සැලකිය යුතුයි.

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු දෙක බැගින් හිමි වේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

### I කොටස

අංක 1 සිට 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. බුදුරජාණන් වහන්සේ අවසාන වස් කාලය ගත කළේ,
1. විශාලා මහ නුවරය.
2. කුසිනාරා නුවරය.
3. බේලුව ගමෙහිය.
4. ඉසිපතනාරාමයේ ය.

02. ඇඟිලි බැඳ දොහොත් මුදුන් නගා වැඳීමට සුදුසු බැවින් මහා සංඝරත්නය,
1. දක්ඛිනෙය්‍ය නම් වේ.
2. අඤ්ජලීකරණීය නම් වේ.
3. පාහුනෙය්‍ය නම් වේ.
4. ආහුනෙය්‍ය නම් වේ.

03. සොළොස්මස්ථාන අතරට අයත් නොවන්නේ,
1. ලෝවාමහාපාය යි.
2. මිරිස වැටිය යි.
3. ජේතවනය යි.
4. ථූපාරාමය යි.

04. බුදු සසුනේ භික්ෂුණී ශාසනය ආරම්භ වූයේ,
1. කිසාගෝතමී තෙරණියගෙනි.
2. ඛේමා තෙරණියගෙනි.
3. යශෝදරා තෙරණියගෙනි.
4. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියගෙනි.

05. ධම්ම පදය අයත් නිකාය වන්නේ,
1. දීඝ නිකාය
2. ඛුද්දක නිකාය
3. අංගුත්තර නිකාය
4. සංයුක්ත නිකාය

06. සිව් බඹ විහරණයට අයත් නොවන්නේ,
1. කරුණාවයි.
2. උපේක්ඛාව යි.
3. මුදිතාවයි.
4. සමානාත්මතාවයයි.

07. සීලයේ පදනම වූ ලෝක පාලක ධර්ම නම්,
1. විරතිය හා සමාදානය වේ.
2. සීලය හා සමාධිය වේ.
3. හිරි හා ඔත්තප්ප වේ.
4. දානය හා ශ්‍රද්ධාව වේ.

08. ගිහි පැවිදි සබඳතාව දක්වා ඇති දිශාව වන්නේ,
1. උඩ දිශාවයි.
2. යටි දිශාවයි.
3. උතුරු දිශාවයි.
4. නැගෙනහිර දිශාවයි.

09. බලංගොඩ සරණගවේසි හිමි පැවිදි බිමට පැමිණියේ,

1. 1911 පෙබරවාරි 02 ය.
2. 1911 මාර්තු 02 ය.
3. 1911 මැයි 02 ය.
4. 1912 මාර්තු 02 ය.

10. දුක්ඛ නිරෝධය යනු,

1. මෝහයයි.
2. ශෝකයයි.
3. තෘෂ්ණාවයි.
4. නිවනයි.

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

**(තෘෂ්ණාව/ කාමසුඛල්ලිකානුයෝගය/ තිදොර/ මිච්ඡා ආජීව/ චේතනාව)**

11. දිවි පැවැත්ම සඳහා අයහපත් වෘත්තීන්හි නියැලීම හඳුන්වන්නේ ............................................. යනුවෙනි.

12. දුකට හේතුව වන්නේ ............................................. යි.

13. සිරුරට අධික ලෙස සැප දීමේ අන්තවාදි පිළිවෙත ..................................................... ලෙස හඳුන්වයි.

14. කර්මය සඳහා මුල් වන්නේ .............................................................යි.

15. සිත, කය, වචනය ............................................................ ලෙස හැඳින්වේ.

- **අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රකාශය හරි නම් ( √ ) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

16. ධම්ම පදය බෞද්ධයාගේ අත් පොතයි ( )

17. අටලෝ දහමින් කම්පා නොවීම මංගල කරුණක් නොවේ. ( )

18. නිවැරදි ලෙස සිහිය පිහිටුවීම සම්මා සතිය වේ. ( )

19. මෛත්‍රී සහගතව සිතීම පැවිදි උතුමන් විසින් ගිහියන්ට කළ යුතු යුතුකමකි. ( )

20. අවි ආයුධ වෙළඳාම ධාර්මික රැකියාවකි. ( )

( ලකුණු 2 x 20 = 40 )

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමු වන ප්‍රශ්නයට ලකුණු 20 ක්ද, 02 සිට 07 දක්වා ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් ද හිමි වේ.**

**01. කෙටි පිළිතුරු සපයන්න.**

(i) මිහිඳු හිමියන් හඳුන්වා දුන් සමාජ ආර්ථික ක්‍රමය සමඟ බෞද්ධ මුහුණුවරක් ප්‍රකාශ වන ජනප්‍රිය ප්‍රකාශය ලියා දක්වන්න.

(ii.) පැරණි සිංහල බෞද්ධ සමාජයේ ප්‍රධාන ජීවනෝපාය කුමක් ද?

(iii.) සංඝරත්නයේ ගුණ 02 ක් ලියන්න.

(iv.) සීලයේ ප්‍රභේද 02 දක්වන්න.

(v.) බුදු දහමට අනුව සැපය දෙයාකාරය. ඒ මොනවා ද?

(vi.) බුදු සසුනේ ඍද්ධිලාභීන් අතර අග්‍රවූයේ කවුද?

(vii.) අනුරාධපුර යුගයේ ඉදි වූ ස්ථූප 02 ක් ලියන්න.

(viii.) බලංගොඩ මෛත්‍රී හිමියන් ලියූ පොත් 02 ක් ලියන්න.

(ix.) සම්මා වාචා සතරාකාරය. ඉන් 02 ක් ලියන්න.

(x.) කර්මයේ ප්‍රභේද 02 ලියන්න. (ලකුණු 2 × 10 = 20)

02. I. සිව් බඹ විහරණ හඳුන්වන වෙනත් නමක් ලියන්න. (ල. 02)

II. එයට අයත් කරුණු 02 ක් පැහැදිලි කරන්න. (ල. 03)

III. මෙම ගුණාංග ප්‍රගුණ කිරීමෙන් පුද්ගලයාට වන යහපත පෙන්වා දෙන්න. (ල. 05)

03. I. සීලය යන්න අර්ථ දක්වන්න. (ල. 02)

II. ත්‍රිකෝටික පාරිශුද්ධ සීලයේ අංශ 03 ලියන්න. (ල. 03)

III. සිල්වත් මිනිසුන් නිසා සමාජය යහපත් වන අයුරු විස්තර කරන්න. (ල. 05)

04. I. අටලෝ දහමින් කරුණු 02 ක් නම් කරන්න. (ල. 02)

II. ඵුට්ඨස්ස ලෝක ධම්මේහි.... ගාථාව ලියා දක්වන්න. (ල. 03)

III. අටලෝ දහමින් අකම්පිත වීමෙන් වන යහපත විස්තර කරන්න. (ල. 05)

05. I. ත්‍රී ශික්ෂාවෙන් කරුණු 02 ක් නම් කරන්න. (ල. 02)

II. සමාධි ශික්ෂාවට අයත් මාර්ග අංග ලියන්න. (ල. 03)

III. එක් මාර්ග අංගයක් විස්තර කරන්න. (ල. 05)

06. I. කර්මය කෙටියෙන් හඳුන්වන්න. (ල. 02)

II. ෂඩ් ශාස්තෘන් අතුරෙන් තිදෙනෙක් නම් කරන්න. (ල. 03)

III. දස අකුසල් ලියා දක්වන්න. (ල. 05)